
# ඩමී



නෙතුලි බිහන්සා ජයරත්න

# චමී

කතෘ - නෙතුලි බිහන්සා ජයරත්න

**කතෘගේ වෙනත් කෘති**

අකීකරු පසිඳු

බිංදුට පාඩමක්

පුංචි මලිති

කැලෑ යාළුවෝ

මහාමායා බාලිකා විදුහල

8 - D

2026.05.10

ISBN 624211092-X

9786242110929

# පිදුම

කතුවර සිහිනය සැබෑ කරන්නට

මං පෙත් විවර කළ

මහාමායා මාතාවට සෙනෙහසින්.............

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත් කතුවරුන් ලෙසට දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවර ද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක්, සන්නිවේදන නිපුණතා, සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොට ගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන්, මගපෙන් වූ ගුරු භවතුන් ඇතුලු සැමට ස්තූතිය පුද කරමු.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

බොහෝ කාලයකට කලින් මුහුදු පතුලේ ගැඹුරුම තැනක දිය කිඳුරු රාජධානියක් තිබුණා. තද නිල් පාට මුහුදු වතුර මැද සුදු පාට සිප්පි කටුවලින්, දිලිසෙන මුතු ඇටවලින් හදලා තිබුණු රාජධානිය හරිම ලස්සනයි. මේ කිඳුරු රාජධානිය පුරාම නිතරම දකින්න ලැබුණේ එක එක පාටවල ලස්සන මාලුවො, ලස්සන මුහුදු පැළෑටි වගේ දේවල්. ඉතින් මේ දේවල් එක්ක කිඳුරු රාජධානිය සුරපුරයක් වගෙයි පෙනුණේ. ලස්සන සුදුපාට සිප්පිකටු මාලිගාවක ජීවත් වන කිඳුරු රැජිණයි, රජතුමයි ගොඩක් හොඳින් කිඳුරු රාජධානිය පාලනය කළා. කිඳුරු රාජධානියේ හැම කෙනෙක්ම ජීවත් වුණේ ගොඩාක් සතුටෙන්.



ඉතින් මේ කිඳුරු රජතුමා ළඟ වැඩ කළා ගොඩක් විශ්වාසවන්ත ඇමතිවරයෙක්. රජතුමාගේ සේවකයෙකුටත් වැඩිය මෙයා රජතුමාගේ හොඳම මිතුරෙක් වගේ. ඉතින්, ඔන්න මේ ඇමතිවරයාටයි, ඒ ඇමැතිවරයාගේ බිරිඳටයි පුංචිම පුංචි ලස්සන දියණියක් ඉපදුණා. පුංචි දියකිඳුරියගේ උපතෙන් හැමෝම ගොඩක් සතුටට පත් වුණා. ඒ පුංචි දියකිඳුරියට නම දැම්මේ එමී කියල. ඇත්තම කිව්වොත් එමීගේ උපත කිඳුරු රාජධානියේ හැමෝටම ගොඩක් වැදගත් වුණා. ඒ මොකද කිව්වොත් එමීගේ උපතත් එක්කම පළවුණ පුදුම හිතෙන අනාවැකියක් නිසා.



කිඳුරු රාජධානියේ චාරිත්‍රයක් තියෙනවා අලුතෙන් දරුවෙක් ඉපදුනාම ඒ දරුවගේ අනාගතය ගැන අනාවැකි බලන. ඉතින් ඒ අනුව එමීගේ අම්මයි තාත්තයි දෙන්නත් පුංචි එමී අරගෙන ගියා කිඳුරු රාජධානියේ ඉන්න අනාවැකි කියන කෙනා ගාවට.

"මේ දරුවා ගොඩක් බලවත් උපතක් තියෙන දරුවෙක්. අනාගතයේ දවසක මේ රාජධානියේ කිරුළ හිමි වෙන්න නියමිත මේ ඉන්න දරුවට"

සාස්තරකරුවා කියපු වචනවලින් එමීගේ අම්මයි තාත්තයි විතරක් නෙමෙයි, රොක් වෙලා හිටපු හැමෝම ගොඩක් පුදුමයට පත්වුණා. ඒ වගේම එමීගේ අම්මයි තාත්තයි, වටේ හිටපු ගොඩක් අයයි මේ ගැන සතුටට පත්වුණා.

හැබැයි මේ අනාවැකියෙන් ගොඩක් කෝපයට පත්වුණ තවත් කෙනෙක් ඒ සෙනග අතරේ හිටියා. ඒ වෙන කවුරුවත් නෙවෙයි, ඒ රාජධානියේ හිටපු නපුරු මන්තරකාරි.



"හිතාගෙන ඇති මේ පුංචි කෙල්ලව කවදා හරි දවසක මේ රාජධානියේ රැජිණ කරන්න... ඒකට කවදාවත්ම මම ඉඩ තියන්නේ නැහැ. මම මේ රාජධානියේ ජීවත් වෙලා ඉන්නකොට කොහෙවත් යන පුංචි කෙල්ලෙකුට මේ රාජධානියේ රැජිණ වෙන්න මම ඉඩ තියන්නේ නැහැ. කොහොම හරි මම මේ රාජධානියේ රජ වෙනවා."

නපුරු මන්තරකාරි ඒ වෙලාවෙම එහෙම අධිෂ්ඨාන කරගත්තා.

අවුරුදු දාසයක් ගතවුණා. දැන් එමී ගොඩක් ලස්සන දිය කිඳුරියක්. එමීට තිබුණේ දුඹුරු පාට දිලිසෙන දිග කොණ්ඩයක්. ඒ වගේම මුහුදු වතුරේ පාට ලස්සනම ලස්සන ඇස් දෙකක්. රාජධානියේ හැමෝගෙම ආදරය දිනාගෙන එමී හොඳින් හැදී වැඩුණා.



එදා එමීගේ තාත්තා ගෙදර ආවේ ටිකක් කලබලෙන්. තාත්තා ළඟ අම්මාටයි එමීටයි  කියන්න ලොකු ආරංචියක් තිබුණා.

"ඔයාල දන්නවද? එමීගේ උපතත් එක්ක පළවුණ අර අනාවැකිය නිසා මේ රාජධානියේ ඉන්න නපුරු මන්තරකාරි ඉන්නේ ගොඩක් තරහෙන්. ඒ මන්තරකාරි අපේ එමීට ලොකු කරදරයක් කරලා හරි මේ රාජධානියේ රජ වෙන්න උත්සාහ කරනවලු."

එමීගේ තාත්තා කියපු වචනවලින් එමීත්, අම්මාත් දෙන්නම ගොඩක් කලබලයට පත් වුනා.

"හරි... දැන් ඔයාලා කලබල වෙන්න එපා. අපි කොහොම හරි මේ ප්‍රශ්නෙට උත්තරයක් හොයා ගමු. මම හෙට ගෙදර එන්නේ මේ ප්‍රශ්නයට උත්තරයක් දැනගෙන."

එමීගේ තාත්තා කිව්වා.

පහුවදා හවස එමීගේ අම්මයි තාත්තයි දෙන්න තීරණය කළා එමීගේ ආරක්ෂාව වෙනුවෙන් එයාව කිඳුරු රාජධානියෙන් පිටතට යවන්න.

ඒ ගැන අහපු එමීගේ හිතට දැනුනේ ලොකු දුකක්. ඒ වුනාට එමී දන්නවා අම්මයි තාත්තයි මේ දේවල් කරන්නේ එයා වෙනුවෙන් තමයි කියලා. ඉතින් ඒ නිසා එමී මේ රාජධානියෙන් පිට වෙලා යන්න හිත හදා ගත්තා.



කිඳුරු රාජධානියෙන් පිටත් වෙන දවසේ එමීගේ අම්මයි, තාත්තයි දෙන්නගෙ ඇස් දෙකේ කඳුළු පිරිලා තිබුණා. ඒ වගේම තමයි, එමීගේ ඇස්වල පිරුණු කඳුළු කම්මුල් දිගේ ගලාගෙන ගියා.


"දුවේ, මම ඔයාට බෙහෙතක් දෙනවා. මේ බෙහෙත ඔයා පණ වගේ පරිස්සම් කරන්න ඕනෙ. මේ බෙහෙතෙන් තමයි ඔයාට මනුස්සයෙක් වෙන්නත්, ආයෙමත් දිය කිඳුරියක් වෙන්නත් අවස්ථාව ලැබෙන්නේ. ඔයා ගොඩබිමට ළං වුණාට පස්සෙ මේ බෙහෙත බීලා මනුස්සයෙක් වෙන්න. ආයෙමත් අපි ඔයාට කතා කරනකොට ඔයාට පුළුවන් මේ බෙහෙතෙන් දිය කිඳුරියක් වෙලා ආයෙමත් මේ රාජධානියට එන්න. ඒ නිසා නිසා මේ බෙහෙත නැති කරගන්න එපා."

එමීගේ අම්මා එමීගේ අතට බෙහෙතක් දුන්නා. ඊට පස්සේ අම්මයි, තාත්තයි දෙන්නම එමීට ගොඩක් උපදෙස් දුන්නා. අන්තිමට තුන්දෙනා සමුදුන්නේ හොඳටම අඬලා.



කොහොම හරි එමී බොහොම දුකින් ලොකුම ලොකු සිප්පි කටුවක නැගලා ගොඩබිමක් කරා එන්න පිටත්වුණා. ඒ සිප්පි කටුව පුරාම එමීට ඕනෑ කරන කෑම බීම වගේ දේවල් පුරවලා තිබුණා. එමී එන ගමන් එයාගේ දුක බෙදා ගත්තේ මුහුදේ පීන පීන හිටපු පුංචි මාළුවො එක්ක. එමී ළඟ තිබුණු කෑම කෑලි කඩලා මාළුවන්ට දුන්නා. මේ නිසා එමී ගොඩබිමට යනකල්ම එමීගේ සිප්පි කටුව වටකරගෙන මාළුවොත් ආවා. ගොඩබිමක් හොයාගෙන එමීට දවස් ගානක් සිප්පි කටුවෙන් යන්න වුණා.

එමී ටිකෙන් ටික මුහුදු වෙරළකට ළං වුණා. ඇතින් ගොඩබිම පේන කොටම එමී අම්මා දීපු බෙහෙත පාවිච්චි කරලා මනුස්සයෙක් වුණා. ඊට පස්සේ සිප්පි කටුවෙනේ බැහැලා මුහුදු වෙරළට ඇවිදගෙන ගියා. එමී මීට කලින් කවදාවත් ඇවිදලා නැහැ. ඒ නිසා එමීට ඇවිදින එක දැනුණේ හරිම නුහුරු විදිහට. ඒ වගේම එමී කවදාවත් ගොඩබිමට ඇවිත් තිබුණේ නැහැ. පොඩි කාලේ අම්මයි තාත්තයි එක්ක මුහුදේ ගල්කුළු පිටිපස්සේ ඉඳලා ගොඩබිම දිහා බලාගෙන හිටියට කවදාවත් ගොඩබිමට ළං වෙලා වත් නැහැ. ඉතින් එමීට දැනුණේ හරිම නුහුරු බවක්. මුහුදු වෙරළ පුරාම මිනිස්සු පිරිලා. ඒ හැමෝම ගොඩක් විනෝදයෙන් වෙරළේ සෙල්ලම් කරමින් තමයි හිටියේ. ඒ අතරේ එමීට දැනුණේ ලොකු තනිකමක්.



ඒත් එමී එකපාරටම දැක්කා එයාගේ වයසේම වගේ ගැහැණු ළමයෙක්. ඒ ගැහැණු ළමයා වෙරළේ ගලක් උඩ වාඩි වෙලා තනියම ලස්සන සිංදුවක් කියමින් හිටියා. ඇත්තටම ඒ සින්දුව හරිම මිහිරියි. සින්දුව වගේම ඒ ගැහැණු ළමයත් ගොඩක් ලස්සනයි, කරුණාවන්ත පාටයි.



ඒ නිසා එමීට හිතුණා ගිහින් ඒ ගැහැණු ළමයත් එක්ක කතා කරන්න. එමී හෙමීට ඒ ගැහැණු ළමයා ගාවට ගිහින් එතන තිබුණු අනිත් ගල උඩ වාඩි වුණා. ටිකකින් ඒ ගෑනු ළමයත් එමී දිහා හැරිලා බැලුවා.ඉතිං ඒ විදිහට දෙන්නා අඳුනගත්තා. එමී එයා ගැන හැම විස්තරයක්ම ඒ ගැහැණු ළමයට කිව්වා. ඒ කතාව අහලා ඒ ගැහැණු ළමයටත් ගොඩක් දුකයි. එයාගේ නම ජුලියා. ජුලියා ඉන්නෙ තනියම. ඒ නිසා ජූලියා කැමැති වුණා එමීගේ හොඳම යාළුවා වෙන්න. ඉතින් ජුලියා එමීව එක්කගෙන ගියා ජූලියාගේ ගෙදරට.

එමීට ජූලියාගේ ගෙදරට ගියාට පස්සේ තමයි මතක් වුණේ එයාගේ අම්මා දීපු බෙහෙත. ඉතින් ජූලියාගේ ගෙදරට ගිහින් බලද්දී ඒ බෙහෙත නැති වුණාම එමී ගොඩක් කලබල වුණා. එයා ඉක්මනට ආයෙමත් වෙරළට දුවගෙන ගියා. ඉතින් වෙරළට ඇවිත් බලනකොට සිප්පි කටුව මුහුද දිගේ ඈතට පාවී ගෙන යනවා. ඒක දැකලා එමීගේ ඇස් වලින් ඉබේටම කඳුළු පැන්නා. එමී ගලක් උඩට වෙලා හොඳටම ඇඬුවා. ඒක දැකලා ජූලියාටත් ගොඩක් දුකයි. හැබැයි ගතවුණේ විනාඩි කිහිපයක් විතරයි. එකපාරටම සිද්ද වුණේ පුදුම හිතෙන දෙයක්. ඈත පාවී පාවී තිබුණ සිප්පි කටුව ගොඩක් වේගයෙන් ආයෙමත් වෙරළ දිහාට පාවීගෙන එනවා. ඒ සිප්පි කටුව වෙරළට පාවෙලා ආවට පස්සෙ තමයි එමී දැක්කේ, ඒ සිප්පි කටුව මාළුවෝ ගොඩක් එකතුවෙලා තල්ලු කරගෙන ඇවිත් කියල. ඒ වෙන කවුරුත් නෙමෙයි, එමී එන ගමන් කන්න දීපු මාළුවෝ. ඉතින් එමීට ගොඩක් සතුටුයි. එයා සිප්පි කටුවේ තිබුණ බෙහෙත අරගෙන මාළුවන්ටත් ස්තුති කරලා ගෙදර ගියා.



ඉතින් එමී එක දවසක් ජූලියත් එක්ක මුහුදු වෙරළේ ඇවිදින්න ගියා.

ටිකෙන් ටික එමී මුහුද දිහාට ඇවිදගෙන යන්න පටන් ගත්තා. ජූලියා හිටියේ වෙරළට වෙලා. හැබැයි මෙතන එමී නොදන්න දෙයක් සිද්ධ වෙමින් තිබුණා. ඒ තමයි, රාජධානියේ ඉන්න නපුරු මන්තරකාරිය මේ වෙලාවේ එමී දිහා ඇහැ ගහගෙන තමයි හිටියේ, ඒ ළඟම තිබුණ ගල් කුළකට මුවා වෙලා.



එමී මේ කිසිම දෙයක් දන්නේ නැති නිසා මුහුද දිහාට හෙමිහිට ඇවිදගෙන ගියා. ඔය අතරේ අර මන්තරකාරිය එක පාරටම ලොකු සුළි කුණාටුවක් මුහුදේ මැව්වා. ඒ එමී වතුරට ගහගෙන යන්න. එක පාරටම කොහේදෝ ඉඳන් ආපු ඒ සුළි කුණාටුව එමීව මුහුද ඇතුලට ගිලගත්තා. අඩුම තරමේ එමීට උදවු ඉල්ලන්නවත් වෙලාවක් තිබුණේ නැහැ. එයා මුහුදේ ගිලිලා ඈතට පා වෙන්න පටන් ගත්තා.

ඔය අතරෙ මේ සිදුවීම වෙරළෙ ඉඳන් ජූලියත් දැක්කා. ජූලියත් හොඳටම බය වෙලා තමයි හිටියේ. ඉතිං ටික වෙලාවකින් එමීව මුහුදු වෙරළට ගොඩ ගැහුවා. ඒ වෙද්දී එමී හිටියේ සිහිය නැතුව. එයාට හොඳටම වතුර පෙව්ලා තිබුණා.

එතැනට ඉක්මනට දුවගෙන ආපු ජූලියා එමීට ආයෙමත් සිහිය අරන් දෙන්න ගොඩක් උත්සාහ කළා. ඉතිං ඒ අතරේ එකපාරටම මුහුදෙ තිබුණ ඒ සුළි කුණාටුව නැවතුණා. ඒකෙන් වටේ හිටපු හැමෝම ගොඩක් පුදුම වුණා.

මොකක්ද දන්නවද එතන ඇත්තටම සිද්ද වෙලා තිබුණේ?. නපුරු මන්තරකාරිය මවපු මේ සුළි කුණාටුව ගැන කිඳුරු රාජධානියටත් දැනිලා තිබුණා. ඉතින් රාජධානියේ රජතුමා, රැජිණ, එමීගේ අම්මා, තාත්තා මේ හැමෝම එකපාරටම මුහුදට ඇවිත් තිබුණේ මන්තරකාරිව පරාද කරන්න. ඉතින් එයාලා එකතුවෙලා ලොකු සුළි කුණාටුවත් නැති කරලා දැම්මා. ඉතින් මේ නිසා මන්තරකාරි හිටියේ ගොඩක් අසරණ වෙලා. එයාට තවත් හැංගිලා ඉන්න නම් බැරිවුණා. මන්තරකාරි එතැනින් පැනලා යන්න හදනකොටම කිඳුරු රජතුමා මන්තරකාරිව අල්ලගත්තා.

"මේ රාජධානියේ අනාගතයේ දවසක ඔටුන්න හිමි වෙන්නෙ එමීටයි කියන එක අනාවැකියක්. ඒ අනාවැකිය ඇත්ත නම් අපට ඒකට ගරු කරන්න සිද්ධ වෙනවා. ඒ දේ නිසා එයාට කිසිම කරදරයක් කරන්න ඉඩ දෙන්න බැහැ. මේ කරලා තියෙන්නෙ ගොඩක් බරපතල වරදක්. මේ වැරැද්දට අනිවාර්යයෙන්ම ලැබිය යුතු දඬුවම් ලැබෙනවා.

ඒ දේවල් අපි රාජධානියේදී තීරණය කර ගනිමු.” කිඳුරු රජතුමා මන්තරකාරිට පැවසුවේ ගොඩක් තදින්.
මන්තරකාරිවත් අරගෙන කිඳුරු රජතුමාගේ ආරක්ෂකයින් රාජධානියට පිටත් වුණා.
ඉතින් ඊට පස්සේ මේ හැමෝම ආවේ එමීව බලන්න. ඒ වෙද්දි ජූලියාගේ උත්සාහය නිසාම එමීට සිහිය ඇවිත් තිබුණා. ඒ වෙලාවේ එතැනට ආපු එමීගෙ අම්මා එමීව බදාගත්තේ කඳුළු සලමින්.

“දුවේ, දැන් අපට පුළුවන් ආයෙමත් ඔයාව අපේ රාජධානියට අරගෙන යන්න.”
ඒමීගේ අම්මාගේ වචනවලින් එමීගේ හිතට දැනුනේ පුදුම සතුටක්. ඒ ගමන්ම එමී එකපාරටම දැක්කේ ජූලියාගේ මුහුණ. ජූලියාගේ මුහුණ දුකෙන් බරවෙලා තිබුණා.
“ එහෙනම් දැන් ඔයා යනවා නේද? ” ජූලියා ඇහුවා.
එමීට යාළුවා දාලා යන්න හිත දුන්නෙම නැහැ. ඉතින් ඒ නිසා එමීගේ හිතට දැනුණේ පුංචි දුකක්. හැබැයි ඒ පුංචි වෙලාවකට විතරයි. එකපාරටම එමීට හොඳ අදහසක් පහළ වුණා.
“ජූලියා, ඔයා කැමතිද දිය කිඳුරියක් විදිහට අපිත් එක්ක අපේ රාජධානියේ ජීවත් වෙන්න?”
ඒ වචන අහපු ජූලියගේ මුහුණ සතුටින් බර වුණා.
“ඇත්තටම එහෙම කරන්න පුළුවන්ද?”
ඒකට පිළිතුරු දෙන්න ඉදිරිපත් වුණේ කිඳුරු රජතුමා.

"ඔව් අනිවාර්යයෙන්ම, විශේෂ සැලකීමක් විදිහට ඉඳලා හිටලා දිය කිඳුරන් ඒවගේ ත්‍යාග මිනිසුන්ට ලබාදෙනවා. ඔයා මෙච්චර කාලයක් එමීට හොඳ මිතුරියක් වුණා. ඒවගේම අද එමීගේ ජීවිතේ බේර ගත්තා. ඒකට තෑග්ගක් විදිහට ඔයා කැමති නම් ඔයාට දිය කිඳුරියක් වෙන්න පුළුවන්."

ජුලියා ඒකට එකඟ වුණේ හද පිරි සතුටින්. ඉතින් එමීගේ අම්මගේ බෙහෙත පාවිච්චි කරලා ජුලියා දිය කිඳුරියක් බවට පත්වුණා. ඉතිං ඊට පස්සේ ඒ හැමෝම කිඳුරු රාජධානියට ආයෙමත් ආවා. සෑහෙන කාලයකට පස්සේ රාජධානියට එන්න ලැබීම ගැන එමීගේ හිතට දැනුණේ ලොකු සතුටක්.

අනාවැකිය විදිහටම කිඳුරු රාජධානියේ රජකම හිමි වුණේ එමීට. නපුරු මන්තරකාරියට සිද්ධවුණේ කිඳුරු රාජධානියේ සිර ගෙදරට වෙලා තමන්ගේ ඉතුරු ජීවිත කාලයම ගත කරන්න. ඉතින් කොහොම හරි මන්තරකාරි නැති නිසා කලින් තිබුණටත් වඩා අපූරු ජීවිතයක් කිඳුරු රාජධානියේ දිය කිඳුරන්ට හිමි වුණා. ඒ වගේම ජුලියා දිය කිඳුරියක් විදිහට මුහුදු පත්ලේ රාජධානියට වෙලා ගොඩක් සතුටෙන් ජීවත් වුණා. එමී රැජිණියක් වුණත් කවදාවත් එමීගෙයි ජුලියගෙයි යාළුකමට කිසිම හානියක් වුණේ නැහැ. ඒ දෙන්නා හැමදාම හොඳම යාළුවෝ විදිහට සතුටෙන් ජීවත් වුණා.



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කළ මෙම ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම් ගබඩාව වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වේ. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරු භවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද දියවඩන නිලමේතුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

ISBN 624211092-X
9 786242 110929

සෙනෙවිරත්න මහ ලේකම්
ව්‍යාපෘති නිර්මාතෘ